WWW.OLEVELAPI.COM



[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

12 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2016 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2016 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2016

ශෛවනෙරි I, II
சைவநெறி I, II
Saivaneri I, II

## ශෛවනෙරි II

※ **පළමුවන** ප්‍රශ්නය හා **දෙවන** ප්‍රශ්නය ඇතුළු ව, ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

※ පළමුවන ප්‍රශ්නයට ලකුණු **20**ක් ද, අනෙකුත් සෑම ප්‍රශ්නයක් සඳහා ම ලකුණු **10** බැගින් ද හිමි වේ.

**1.** පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) 'වේදම්' යන වචනයේ තේරුම කුමක් ද?

(ii) ශෛව භක්තිකයින් ආහාර ගැනීමට පෙර ගැයිය යුතු ගීතිකාව කුමක් ද?

(iii) "රාජකාරිය ඉටු කරන්න, ප්‍රතිඵලය බලාපොරොත්තු නොවන්න" යනුවෙන් සඳහන් කරන ශුද්ධ වූ ග්‍රන්ථය කුමක් ද?

(iv) 'කන්නිගා තානම්' යනු මොනවා ද?

(v) සුන්දරමූර්ති නායනාර්තුමන්ගේ ගුරු පූජා දිනය කවදා ද?

(vi) 'සත්තසත්තෙ සාරා තසත්තරියා තංකණිවෙ
උයිත්තල්සද සත්තා මුයිර්'
මෙහි සඳහන් වන 'සදසත්තු' යන්නෙන් අදහස් කෙරෙන්නේ කුමක් ද?

(vii) නිවසක දිනපතා සිදුවන ආගමික කටයුතු **දෙකක්** ලියන්න.

(viii) 'අෂ්ටබන්දනම්' තුළ අඩංගු වන ද්‍රව්‍ය **දෙකක්** ලියන්න.

(ix) අරුණගිරිනාදර්තුමා විසින් මුරුග දෙවියන් උදෙසා රචනා කරන ලද භක්ති සාහිත්‍ය **දෙකක්** නම් කරන්න.

(x) ශෛව භක්තිකයකු තුළ පැවැතිය යුතු උසස් ගතිලක්ෂණ **තුනක්** සඳහන් කරන්න.

**2.** (i) පහත සඳහන් ගීතිකා **දෙකක්** නිවැරදිව හා නියම අනුපිළිවෙළට ලියන්න.

(ii) ඉහත (i) ට අදාළ ව ඔබ විසින් ලියන ලද ගීතිකාවල තේරුම ලියන්න.

(අ) "අංගමුම් වේදමුම් ඕදුනාවර්... "

(ආ) "තන්දදුන් තන්නෙක් කොණ්ඩදෙන්... "

(ඉ) "උම්බර්තරු තේනුමණික් කසිවාගි..."

(ඊ) "තනම්තරුම් කල්වි තරුම්..."

(උ) "තණ්ණලි වෙන්කුඩෛ වේන්දන් සෙයල්කණ්ඩු... "

**3.** "ශ්‍රී ලාංකේය ශෛව ආගමික ඉතිහාසයේ ශ්‍රීලශ්‍රී ආරුමුග නාවලර්තුමාට සුවිශේෂ ස්ථානයක් හිමි වේ."

(i) ආරුමුග නාවලර්තුමා නල්ලූර්හි ස්ථාපිත කළ මුද්‍රණාලයේ නම කුමක් ද?

(ii) ආරුමුග නාවලර්තුමා විසින් රචනා කොට, ප්‍රකාශයට පත් කරන ලද ග්‍රන්ථ **තුනක්** සඳහන් කරන්න.

(iii) ආරුමුග නාවලර්තුමාගේ ශෛව ආගමික සේවා **තුනක්** කෙටියෙන් පැහැදිලි කරන්න.

**4.** "ආධ්‍යාත්මික නිදහසට ඇති මාර්ගවලින් 'ශෛව නාට්පාදංගල්' ප්‍රමුඛත්වයක් ගනී."

(i) තායුමානවර්, ශෛව නාට්පාදංගල් සංසන්දනය කරන්නේ මොනවාට ද?

(ii) 'කිරියෙවල සරියෛ' යන්නෙන් අදහස් වන්නේ කුමක් ද?

(iii) කිරියෛ මාර්ගය පිළිබඳව විස්තර කරන්න.

[හයවැනි පිටුව බලන්න

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

5. "එන් කඩන් පණි සෙයිදු කිඩප්පදේ..." - අප්පර් තේවාරම්

(i) තිරුනාවුක්කරසර්ගේ තේවාරම්වල 'පදිගම්' කීයක් තිබේ ද? ඒවා තිරුමුරෙ කීයකට බෙදා ඇත් ද?

(ii) ශිව දෙවියන් විසින් තිරුනාවුක්කරසර්ට තබන ලද මුද්‍රා **දෙක** මොනවා ද? එම අවස්ථාවේ ගයනු ලැබූ ගීතිකාව කුමක් ද?

(iii) තිරුනාවුක්කරසර් කළ හාස්කම් **පහක්** කෙටියෙන් පැහැදිලි කරන්න.

6. "කේඩුම් ආක්කමුම් කෙට්ට තිරුවිනාර්
ඔඩුම් සෙම්පොනුම් ඔක්කවේ නෝක්කුවාර්
කූඩුම් අන්බිනිල් කුම්බිඩලේ අන්ද්‍රි
විඩුම් වෙන්ඩා විරලින් විලංගිනාර්" - පෙරිය පුරාණම්

(i) පෙරිය පුරාණම් නම් ග්‍රන්ථය රචනා කළේ කවුද? එය කීවෙනි තිරුමුරෙවල අඩංගු වී ඇත් ද?

(ii) ශිව භක්තිකයන්ගේ සුවිශේෂතා මෙම ගීතිකාවෙන් විස්තර කර ඇත්තේ කෙසේ ද?

(iii) පෙරිය පුරාණම් පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න.

7. පහත සඳහන් මාතෘකාවලින් **දෙකක්** තෝරා ගෙන, කෙටි සටහන් ලියන්න.

(i) පංචාංගම්

(ii) සුවාමි විපුලානන්දර්

(iii) විනායගර්ෂෂ්ටි උපවාසය

(iv) ශෛව දේවාල මගින් කෙරෙන සමාජ සේවා

* * *

WWW.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...